සියලු ම හිමිකම් ඇවිරිණි. / All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

## තෙවන වාර පරීක්ෂණය - 07 - 2023
## Third Term Test - Grade 07 - 2023

## ප්‍රායෝගික හා තාක්ෂණික කුසලතා

**කාලය මිනි. 40 යි**

උපදෙස් :
- තෝරාගත් එක් ක්ෂේත්‍රයකට අදාළව ඇති ක්‍රියාකාරකමක නිරත වන්න.
- සෑම ක්ෂේත්‍රයකට ම අදාළව ඇති ක්‍රියාකාරකමක් සඳහා නිර්ණායක පහක් ඇති අතර එක් නිර්ණායකයකට ලකුණු 5 බැගින් මුළු ලකුණු 25 ක් හිමිවේ. අවසානයේ එම ලකුණු 100 ට පරිවර්තනය කර ලකුණු ලබා දෙනු ලැබේ.

**ප්‍රායෝගික ක්‍රියාකාරකම අංක** 01 - කෘෂිකර්මය

02 - ආහාර

03 - ආරම්භක තාක්ෂණය

04 - ව්‍යාපාර කටයුතු

05 - රූපණ

සියලු ම හිමිකම් ඇවිරිණි. / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

තෙවන වාර පරීක්ෂණය - 07 - 2023
Third Term Test - Grade 07 - 2023

# ප්‍රායෝගික හා තාක්ෂණික කුසලතා

කාලය මිනි. 40 යි

## ප්‍රායෝගික ක්‍රියාකාරකම් අංක 01 – කෘෂිකර්මය

**අවශ්‍ය ද්‍රව්‍යය**

මතුපිට පස්, වැලි, කොම්පොස්ට්, තවාන් බඳුන්, අතු කැබලි කිහිපයක්

**උපකරණ**

අත් ඉස්කෝප්පයක්, මල් බාල්දියක්, සෙකටේරිය, බද්ධ පිහිය

**ගුරු උපදෙස්**

- ඉහත උපකරණ හා ද්‍රව්‍ය සපයා කාර්ය පරිශ්‍රය සකස් කිරීම.
- සිටුවීමට අවශ්‍ය දඬුකැබලි සකස් කර ගැනීමට අවශ්‍ය සහයෝගය ලබාදීම.

**සිසු උපදෙස්**

- කාර්ය පරිශ්‍රයේ ඇති ද්‍රව්‍ය හා උපකරණ උපයෝගී කර ගනිමින් දඬු කැබැල්ල නිවැරදි ආකාරයෙන් බඳුන් ගත කරන්න.

**ලකුණු ලබාදීමේ ක්‍රමවේදය**

- නිවැරදිව අතු කැබලි තෝරාගැනීම හා සැකසීම (ලකුණු 05)
- රෝපන ද්‍රව්‍ය බඳුන් වලට පිරවීම (ලකුණු 05)
- කාල කළමනාකරණය (ලකුණු 05)
- බඳුන් ගත කරන ලද දඬු කැබැල්ලේ නිමාව (ලකුණු 05)
- නැවත කාර්ය පරිශ්‍රය සැකසීම (ලකුණු 05)

සියලු ම හිමිකම් ඇවිරිණි. / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

**තෙවන වාර පරීක්ෂණය - 07 - 2023**
**Third Term Test - Grade 07 - 2023**

**ප්‍රායෝගික හා තාක්ෂණික කුසලතා**

**කාලය මිනි. 40 යි**

## ප්‍රායෝගික ක්‍රියාකාරකම් අංක 02 – ආහාර

- ආහාර සකස් කරන පුද්ගලයකු විසින් පැළඳිය යුතු ඇඳුම් කට්ටලය

**අවශ්‍ය ද්‍රව්‍යය**

1. කාවාඩම (ඒප්‍රන්)
2. හිස් වැස්ම
3. අත් ආවරණ
4. අත්පිස්නාව
5. මුඛ ආවරණ

**ගුරු උපදෙස්**

1. ඉහත ඇඳුම් කට්ටලය සූදානම් කිරීම.
2. ඒවායේ නම සඳහන් කාඩ්පත් සූදානම් කිරීම.
3. පහත වගුව සූදානම් කිරීම.

මෙම ඇඳුම් කට්ටලය සුදුසු ස්ථානයක ස්ථානගත කර, වගුව ලියූ කාඩ්පත් බෙදා දීම. ඇඳුම් කට්ටලයේ නම් ලියූ කාඩ්පත් කට්ටල 2 පමණ කලවම් කර තැබීම.

**සිසු උපදෙස්**

1. ඇඳුම් කට්ටලය හඳුනාගෙන ඒවායේ නම් සොයා අදාළ ඇඳුම තෝරා නම ඇලවීම.
2. වගුවේ සඳහන් කරුණු පිරවීම.
3. තනි තනිවම මෙම කාර්යය කළ යුතුයි.

| ඇඳුම | කාර්යය |
|---|---|
| 1. කාවාඩම | |
| 2. අත් පිස්නාව | |
| 3. හිස් වැස්ම | |
| 4. අත් ආවරණ | |
| 5. මුඛ ආවරණ | |

**නිර්ණායක**

එක් කොටසකට ලකුණු 10 බැගින්

1. වගුව පිරවීම (ලකුණු $4 \times 5 = 20$)
2. ඇඳුමේ නම නිවැරදිව තේරීම (ලකුණු $1 \times 5 = 5$)

(මුළු ලකුණු 25)

සියලු ම හිමිකම් ඇවිරිණි. / All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

තෙවන වාර පරීක්ෂණය - 07 - 2023
Third Term Test - Grade 07 - 2023

## ප්‍රායෝගික හා තාක්ෂණික කුසලතා

කාලය මිනි. 40 යි

## ප්‍රායෝගික ක්‍රියාකාරකම් අංක 03 – ආරම්භක තාක්ෂණය

ලියුම් කවරයක් සෑදීම

**අවශ්‍ය ද්‍රව්‍ය උපකරණ**


- A4 සුදු කොළයක්
- කතුර
- ගම්
- අඩිකෝදුව

**ගුරුවරයාට උපදෙස්**

- නියමිත දිනට අවශ්‍ය ද්‍රව්‍ය රැගෙන ඒම සඳහා දරුවන් දැනුවත් කිරීම.
- ක්‍රියාකාරකම සඳහා දරුවන්ට අවශ්‍ය සහය ලබාදීම.
- නිර්ණායක අනුව ලකුණු පිරිනැමීම.

**සිසුන් සඳහා උපදෙස්**

- අවශ්‍ය ද්‍රව්‍ය උපකරණ සපයා ගන්න.
- A4 කොළය කෙළවර සිට රූපයේ පෙනෙන පරිදි 3.5 cm ක් ඇතුලතින් රේඛාවක් අඳින්න.
- අඳින ලද රේඛාවේ සිට 14 cm ක් ලකුණු කර රේඛාවක් අඳින්න.
- A4 කොළයේ දිග දෙපසින් 1.5 cm ක් බැගින් ඇතුලට ලකුණු කරන්න.
- රූපයේ පරිදි A, B, C, D කොටස් ලකුණු කරන්න.
- රූපයේ අඳුරු කර ඇති කොටස් අඳුරු කර කපා ඉවත් කරන්න.
- කඩ ඉරි දිගේ නවන්න D කොටස මතට C කොටස නවා A හා B කොටස් නවා ගම් ගා අලවන්න.
- C මතට E කොටස නවන්න.




**ලකුණු දීමේ නිර්ණායක**

1. ක්‍රියාකාරකමට අවශ්‍ය ද්‍රව්‍ය උපකරණ සපයා ගැනීම. (ලකුණු 05)
2. මිමි නියමිත පරිදි සලකුණු කිරීම. (ලකුණු 05)
3. කපා ඉවත් කළ යුතු කොටස් කපා ඉවත් කිරීම (ලකුණු 05)
4. ලියුම් කවරය නිවැරදිව සැකසීම. (ලකුණු 05)
5. නිමාව, නියමිත කාලය තුළ නිම කිරීම, වැඩ ස්ථානය පිරිසිදු කිරීම (ලකුණු 05)

සියලු ම හිමිකම් ඇවිරිණි. / All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education - NWP

## තෙවන වාර පරීක්ෂණය - 07 - 2023
## Third Term Test - Grade 07 - 2023

## ප්‍රායෝගික හා තාක්ෂණික කුසලතා

කාලය මිනි. 40 යි

## ප්‍රායෝගික ක්‍රියාකාරකම් අංක 04 - ව්‍යාපාර කටයුතු

**ක්‍රියාකාරකම**

පරිසරයෙන් සොයාගත හැකි ද්‍රව්‍ය භාවිතයෙන් ඔබ කැමති ප්‍රයෝජනවත් නිර්මාණයක් කරන්න.

**ගුරු උපදෙස්**

1. සිසුන්ට කළ හැකි නිර්මාණ පිළිබඳව දැනුවත් කරන්න.
2. නිර්මාණයක ප්‍රයෝජනවත් බව යන්න සිසුන්ට පැහැදිලි කර දෙන්න.
3. නිර්මාණය කිරීම සඳහා පරිසරයෙන් සපයා ගත හැකි ද්‍රව්‍ය පිළිබඳව නිදසුන් ඇසුරින් පැහැදිලි කර දෙන්න. (කල්තියා දැනුවත් කරන්න)
4. ඇගයීම් නිර්ණායක පිළිබඳව සිසුන් දැනුවත් කරන්න.
5. නිර්මාණය කිරීම සඳහා ලබා දෙන කාලය පිළිබඳව සිසුන් දැනුවත් කරන්න.
6. නිර්මාණය කිරීමට අවශ්‍ය වන සම්පත් (ද්‍රව්‍ය) වල මූලික සූදානම (කැපීම් කෙටීම්) නිවසින් ම කර ගෙන එන ලෙස සිසුන්ට දැනුම් දෙන්න.

**ඇගයීම් නිර්ණායක**

| | | |
|---|---|---|
| 1. | පෙර සූදානම | (ලකුණු 05) |
| 2. | ප්‍රයෝජනවත් බව | (ලකුණු 05) |
| 3. | නිර්මාණශීලී බව | (ලකුණු 05) |
| 4. | නියමිත කාලය තුළ කාර්ය නිම කිරීම | (ලකුණු 05) |
| 5. | කාර්ය පරිශ්‍රය පිරිසිදු කිරීම | (ලකුණු 05) |
| | | (මුළු ලකුණු 25) |

සියලු ම හිමිකම් ඇවිරිණි. / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

තෙවන වාර පරීක්ෂණය - 07 - 2023
Third Term Test - Grade 07 - 2023

# ප්‍රායෝගික හා තාක්ෂණික කුසලතා

කාලය මිනි. 40 යි

## ප්‍රායෝගික ක්‍රියාකාරකම් අංක 05 – රූපණ

පොත් සලකුණක් නිර්මාණය (Book mark)

**අවශ්‍ය ද්‍රව්‍ය උපකරණ**


- 16 cm දිග 4 cm ක් පළල කාඩ්බෝඩ් කැබැල්ලක්
- 12 cm ක් දිග රිබන්/ කෝඩ් නූල් කැබැල්ලක්
- පංචරයක් (ගුරුවරයාට)
- අලංකාර කිරීම සඳහා කඩදාසි කැටයමක්
  (16 cm දිග 4 cm ක් පළල තදපාට ලාපාට කොටස් 2ක්)
- ගම්

**ගුරුවරයාට උපදෙස්**

- නියමිත දිනට අවශ්‍ය ද්‍රව්‍ය උපකරණ රැගෙන ඒමට දරුවන් දැනුවත් කරන්න.
- ක්‍රියාකාරකම සඳහා දරුවන්ට අවශ්‍ය සහය ලබා දෙන්න.
- නිර්ණායක අනුව ලකුණු ලබා දෙන්න.

**සිසුන් සඳහා උපදෙස්**

- අවශ්‍ය ද්‍රව්‍ය උපකරණ සපයා ගන්න.
- නියමිත දිග පළල අනුව සපයා ගත් A4 කොළයේ මෝස්තරය ඇඳ කපා ඉවත් කළ හැකි කොටස් අඳුරු කරන්න.
- අඳුරු කළ කොටස් කපා ඉවත් කරන්න.
- තද පාට A4 කොළයේ කඩදාසි කැටයම අලවන්න.
- සකස් කළ කඩදාසි කැටයම 16 cm දිග 4 cm පළල කාඩ්බෝඩ් කොටසේ අලවා ගන්න.
- රූපසටහනේ පරිදි ඉහල කෙළවරේ පංචර් කරන්න.
- නූලක් හෝ රිබන් පටි කොටසක් පංචර් කළ කොටසේ ගැට ගසා අලංකාර කර ගන්න.




**ලකුණු දීමේ නිර්ණායක**

1. අවශ්‍ය ද්‍රව්‍ය උපකරණ රැස්කර ගැනීම. (ලකුණු 05)
2. A4 කොළයේ මිමි අනුව කපා කඩදාසි කැටයමකට සුදුසු නිර්මාණයක් ඇඳ ගැනීම. (ලකුණු 05)
3. කඩදාසි කැටයම කපා කාඩ්බෝඩ් එක මත අලවා ගැනීම. (ලකුණු 05)
4. සිදුරු විද නූල/ රිබන් කොටස දැමීම. (ලකුණු 05)
5. නිමාව නියමිත කාලය තුළ නිම කිරීම. (ලකුණු 05)

(මුළු ලකුණු 5 × 5 = 25)